VOICE OF CITIZENS

CENTRE FOR POLICY ALTERNATIVES
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# POLICY BRIEF

2023 / JANUARY

# ප්‍රතිපත්ති සංක්ෂිප්තය

# ශ්‍රී ලංකාවේ ආදිවාසී ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් සුරැකීම

පුරවැසි හඬ - ජනවාරි 2023

# ප්‍රතිපත්ති සංක්ෂිප්තය

# ශ්‍රී ලංකාවේ ආදිවාසී ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් සුරැකීම

## විධායක සාරාංශය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ දක්වා ඇති මූලික අයිතිවාසිකම්[1] අන්‍යෝන්‍ය වශයෙන්, සෑම තැනැත්තකුට ම සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස; කිසිම තැනැත්තකු වධ හිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකිරීමේ නිදහස; අත්තනෝමතිකව සිරභාරයට ගැනීමෙන්, රඳවා තබා ගැනීමෙන් සහ දඬුවම් කිරීමෙන් නිදහස සහ අතීතයට බලපාන දණ්ඩන නීති පැනවීම තහනම් කිරීම; භාෂණයේ නිදහස, සාමකාමීව රැස්වීමේ නිදහස; සමාගමයේ නිදහස, යාම් ඊම් නිදහස සහ වෘත්තියක යෙදීමේ නිදහස ආරක්ෂා කරයි.

කෙසේ වෙතත්, ඌව, උතුරු මැද, නැගෙනහිර, සබරගමුව සහ උතුරු පළාත් ඇතුළුව නමුත් ඒවාට පමණක් සීමා නොවී රට පුරා වෙසෙන ආදිවාසී ප්‍රජාවන්ට එම මූලික අයිතිවාසිකම් භුක්ති විඳීමට හිතකර සමාජ-ආර්ථික හා දේශපාලන පසුබිමක් තිබේද යන්න ගැටලුවකි. සාමාන්‍යයෙන් මිනිසුන්ගේ අයිතිවාසිකම් හා සම්බන්ධ නොනවතින ගැටලු සහ අභියෝග පවතින නමුත්, සමාන අයිතිවාසිකම් ඇති පුරවැසියන් ලෙස තමන් කටයුතු  කර ගැනීමේදී "ආදිවාසී" ප්‍රජාවන් යන අර්ථයට අයත් වන පුරවැසියන් සහ "ආදිවාසී" ලෙස තමන්ව හඳුන්වා ගැනීමට කැමති අය අනෙකුත් ප්‍රජාවන්ට වඩා අවදානමට සහ අභියෝගවලට මුහුණ දෙති. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (2) වගන්තියේ සඳහන් වන ලෙස කිසිම පුරවැසියකු වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විශේෂයකට හෝ භාජන නොවිය යුත්තේ ය. වෙනස් කොට සැලකීම සහ බැහැර කිරීම හුදු මූලික අයිතිවාසිකම් එකක් හෝ කිහිපයක් උල්ලංඝනය කිරීමකට සීමා නොවෙන අතර ඒවා ඔවුන්ගේ සමාජ, ආර්ථික, සංස්කෘතික, සිවිල් සහ දේශපාලන ජීවිතය යන ක්ෂේත්‍රවල අයිතිවාසිකම් මත පදනම් වූ ගැටලු රාශියකට මග පාදයි.

එක්සත් ජාතීන්ගේ ආදිවාසී ජනතාවගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනය (A/RES/61/295)[2] හරහා ලොව පුරා සිටින ආදිවාසීන්ගේ අයිතිවාසිකම් ජාත්‍යන්තරව පිළිගෙන ඇති අතර, ඔවුන්ගේ වාර්ගික අනන්‍යතාවයන් අහිමි කිරීම, ඔවුන්ගේ ඉඩම්, ප්‍රදේශ හෝ සම්පත් ඔවුන්ගෙන් ඉවත් කිරීම සහ ඔවුන්ට එරෙහි කිසියම් වාර්ගික හෝ වාර්ගික වෙනස්කම් කිරීමේ අරමුණක් හෝ බලපෑමක් ඇති කරන ක්‍රියාවන් වැළැක්වීම සඳහා ඵලදායී යාන්ත්‍රණයන් සැපයීම සඳහා සාමාජික රටවලින් දැඩි ඉල්ලීමක් කර ඇත.

ශ්‍රී ලංකාව ආදිවාසීන්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනයට (A/RES/61/295) පක්ෂව ඡන්දය ප්‍රකාශ කර ඇතත්,[3] පැවැත්ම, අනන්‍යතාව සහ අයිතිවාසිකම් පැහැදිලිව පිළිගන්නා නිශ්චිත ප්‍රතිපත්ති රාමුවක් හෝ නීත්‍යානුකූලව බැඳී ඇති මෙවලමක් නොමැතිකම මෙම ආදිවාසී ප්‍රජාවන් අඛණ්ඩව මර්දනයට සහ වෙනස් කොට සැලකීමට ලක් කරයි. තවද, ආදිවාසීන්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනයේ විධිවිධාන කිසිවක් හෝ 1989 ආදිවාසී සහ ගෝත්‍රික ජනතා සම්මුතියේ (අංක 169)[4] විධිවිධාන කිසිවක් දේශීය නෛතික හෝ ප්‍රතිපත්ති රාමුවට පරිවර්තනය කර සම්මත කර ගෙන නොමැත. එබැවින්, ප්‍රතිපත්ති සම්පාදකයින්, නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන්ගේ සහ පරිපාලකයින් යන දෙඅංශයේම ඇතැම් අසංවේදී දුරනොදක්නා, හිතුවක්කාර සහ ඇතැම් විට හිතාමතා වෙනස් කොට සැලකීමේ ක්‍රියා නිසා ශ්‍රී ලංකාවේ "ආදිවාසී" ප්‍රජාවන්ගේ පැවැත්මේ ඇති අවදානම තව තවත් තීව්‍ර වී ඇත.

---

[1] https://www.parliament.lk/files/pdf/constitution.pdf

[2] https://www.un.org/development/desa/indigenouspeoples/wp-content/uploads/sites/19/2018/11/UNDRIP_E_web.pdf

[3] https://digitallibrary.un.org/record/609197?ln=en

[4] https://www.ilo.org/dyn/normlex/en/f?p=NORMLEXPUB:12100:0::NO::P12100_ILO_CODE:C169

මෙම කෙටි සටහන මගින් ශ්‍රී ලංකාවේ "ආදිවාසී" ප්‍රජාවන් මුහුණ දෙන මූලික ගැටලු පිළිබඳ සාරාංශයක් ලබා දීමටත් එම ගැටලු විසඳීම සඳහා යෝජිත ප්‍රතිපත්තිමය මැදිහත්වීම් ඉදිරිපත් කිරීමටත් අපේක්ෂා කෙරේ.

## ශ්‍රී ලංකාවේ ආදිවාසී ප්‍රජාවන් මුහුණ දෙන මූලික ගැටලු

- ශ්‍රී ලංකාවේ විවිධ ආදිවාසී (ස්වදේශී) ප්‍රජාවන් නියෝජනය කරන පුද්ගලයන් සඳහා විධිමත් ව්‍යවස්ථාපිත හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය පිළිගැනීමක් නොමැති වීම. එවැනි පිළිගැනීමක් තුළ ආදිවාසී ප්‍රජාවගේ අයිතිවාසිකම් සහතික කිරීම අත්‍යවශයෙන්ම අන්තර්ගත අංගයක් විය යුතුය.

- ශ්‍රී ලංකාවේ විවිධ ආදිවාසී ප්‍රජාවන් නියෝජනය කරන පුද්ගලයන් සඳහා විධිමත් ව්‍යවස්ථාපිත හෝ ප්‍රතිපත්තිමය සුවිශේෂී වූ ආර්ථික, සමාජීය, සංස්කෘතික[5], සිවිල් සහ දේශපාලන අයිතීන්[6] ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා පැහැදිලිවම ප්‍රතිපාදන සපයන නිශ්චිත නීති සම්පාදනය නොකිරීම.

- ආදිවාසි ප්‍රජාවන්ගේ සිවිල්, දේශපාලන, සමාජ-ආර්ථික සහ සංස්කෘතික අයිතීන් කෙරෙහි සංවේදීතාවකින් තොරව නීතිය ක්‍රියාත්මක කිරීම, ප්‍රධාන වශයෙන් ඔවුන්ගේ ජීවනෝපාය සඳහා ඇති අයිතිය ඇතුළුව, ඔවුන්ගේ පැවැත්ම කෙරෙහි අසමාන බලපෑම් ඇති කරයි.

- ආදිවාසි ප්‍රජාව ඔවුන්ගේ සාම්ප්‍රදායික ජීවනෝපායන් හා බැඳි කටයුතු අපරාධනීය වරදවල් වශයෙන් පෙන්වන පසුබිමක් ඇති නිසාත් වනාන්තරවලට ඇතුළුවීම තහනම් කර ඇති නිසාත් ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබාගැනීම කෙරේ යොමු වී විකල්ප ජීවනෝපායන් සොයා යාම දක්වා ඔවුන් පෙළඹී ඇත. තම පාරම්පරික වාසස්ථානවලින් ඉවත් කරන ලද ආදිවාසීන් බලහත්කාරයෙන් නැවත පදිංචි කිරීමේ ප්‍රතිඵලයක් ලෙස වාසය කිරීමට මූලික ස්ථානයක් ගොඩනගා ගැනීම සඳහා මුදල් ණයට දෙන ආකාරයේ මූල්‍ය සේවා සපයන්නන්ගෙන් මූල්‍ය පහසුකම් ලබා ගැනීමට පෙළඹවීමක් ඇත. මේ වන විට ඔවුන් ද ක්ෂුද්‍ර මූල්‍ය ණය උගුලට හසු වී ඇත. කාන්තාවන් ඉලක්ක කරගෙන ඔවුන්ට නොතේරෙන, කියවීමට නොහැකි භාෂාවන් වලින් යුක්ත වූ ණය ගිවිසුම්වලට එළඹ ඇත. අධික පොලී අනුපාත සහ නීති විරෝධී සහ සදාචාර විරෝධී අයකර ගැනීමේ ක්‍රම මගින් ඔවුන් සූරාකෑමට ලක්ව ඇත. අනිසි ලෙස ණය දීම සහ එකතු කිරීමේ පිළිවෙත් විනිවිදභාවයෙන් හෝ ණය ගනුදෙනු හා බැඳි මූලික මාර්ගෝපදේශ අනුගමනය නොකරයි. ආදිවාසී ප්‍රජා සාමාජිකයින් චෝදනා කරන්නේ ඔවුන් ක්ෂුද්‍ර ණය සහ වෙනත් ආකාරයේ මුදල් ණයට දීමේ ක්‍රියාකාරකම්වලට කොටු වී පුළුල් සමාජ ප්‍රශ්න උද්ගතව ඇති බවයි. මූල්‍ය අන්තර්කරණය සහ දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන මූලික අරමුණ තිබියදීත්, ක්ෂුද්‍ර මූල්‍ය භාවිතය පාරිභෝගික ආරක්ෂණය සම්බන්ධයෙන් දැඩි ගැටලුකාරී තත්ත්වයක් උද්ගත කර ඇත (නොමග යවන ණය ගිවිසුම් තොරතුරු, අධික පොලී අනුපාත ආදිය). බොහෝ ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන්වල පදනම වන කණ්ඩායම් ණය දීමේ ප්‍රවේශය වන අතර ණය ආපසු ගෙවීම සම්බන්ධයෙන් එවන් කණ්ඩායම්වල අනෙකුත් සාමාජිකයන්ගේ පීඩනයන්හි ප්‍රතිඵලයක් ලෙස කී ණයලාභීන් දැඩි අපවාදයන්ට ලක්වීමට ද හේතු වී ඇත. උදාහරණ ලෙස ආක්‍රමණශීලී ණය එකතු කිරීමේ ක්‍රම (උදා., දෛනිකව සිදුවන හිරිහැර, ප්‍රජාව ඉදිරියේ අවමානයට ලක් වීම, සමාජ බැහැර කිරීම් ආදිය) මෙන්ම පුද්ගලිකත්වයට ඇති අයිතිය හා බැඳි ගැටලු ද ඇතුළත් වේ.

- රටේ විවිධ ප්‍රදේශවල විවිධ ආදිවාසි ප්‍රජාවන්ගේ ශක්තිමත් සහ යාවත්කාලීන වූ සමාජ-ආර්ථික

[5] https://www.ohchr.org/sites/default/files/cescr.pdf

[6] https://citizenslanka.org/wp-content/uploads/2015/12/International-Covenant-on-Civil-Political-Rights-ICCPR-Act-No-56-of-2007E.pdf

පැතිකඩක් නොමැතිකම හේතුවෙන් පිළිගැනීමක් නොමැතිකම, බැහැර කිරීම සහ කොන් කිරීම සිදුවේ. එමගින් එවැනි ප්‍රජාවන් දිගින් දිගටම වෙනස්කම්වලට ලක්වේ.

➔ ආදිවාසී ප්‍රජාවන්ගේ අයිතීන් ඔවුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින දුර්වල ප්‍රජා මූලික ආයතන සමඟම උල්ලංඝනය වන විට දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණයක් සහ සාධාරණ නඩු විභාග යක් නොමැතිකම. එමනිසා, ඔවුන් අසාධාරණයට ලක්වීමේ අවදානම නොවැළැක්විය හැකිය.

➔ පරිපාලනමය තීරණ, ඇතැම් විට දේශපාලනික චේතනාවන් මත ක්‍රියාත්මක විය හැකි අතර, ආදිවාසී ප්‍රජාවන්ට ස්වකීය සංස්කෘතිය භුක්ති විඳීමට සහ ප්‍රවර්ධනය කිරීමට සහ ඔවුන්ගේ භාෂාව භාවිත කිරීමට, රැකියාවක නියුතු වීමේ සහ ගමන් කිරීමේ නිදහසට මෙයින් ඍජු හෝ වක්‍ර ප්‍රතිවිපාක ඇති කරයි. තවද, ඔවුන්ගේ පුරවැසිභාවය ස්ථාපිත කිරීමේදී සහ එමගින් පොදු සේවාවන් වෙත ප්‍රවේශ වීමේදී රාජ්‍ය පාර්ශ්වයෙන් ආයතනික පිළිගැනීමක් නොමැතිකම දැඩි බාධාවක් වන අතර ඔවුන් බැහැර කිරීමට හේතු වේ.

➔ සාමාන්‍යයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම්වල කොටසක් ලෙස පිළිගෙන නොතිබුණද, ආදිවාසී ප්‍රජාවන්ගේ ජීවනෝපාය අයිතීන් ස්වභාවික සම්පත් සමඟ සමීපව සම්බන්ධ වී ඇත, විශේෂයෙන් ඔවුන්ගේ වාසස්ථාන හෝ මුතුන් මිත්තන්ගේ භූමි ප්‍රදේශවල, ඔවුන්ට සාමකාමීව ජීවත්වීමට සුදුසු පරිසරයක් සහතික කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතුය. සාමකාමීව ජීවත්වීම කෙසේ වෙතත්, සංවර්ධන සැලසුම් සහ පරිපාලන තීරණ ඇතුළු හේතු රාශියක් නිසා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, පරිසර අමාත්‍යාංශය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, පොලිස් දෙපාර්තමේන්තුව, මහවැලි සංවර්ධන අධිකාරිය, ඉඩම් අමාත්‍යාංශය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, ආයුර්වේද දෙපාර්තමේන්තුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සහ ධීවර දෙපාර්තමේන්තුව ආදිවාසී ප්‍රජාවන්ගේ අයිතීන් සුරැකීමේ වැදගත්කම ගැන සංවේදී නොවීම නිසා ඔවුන්ගේ පාරම්පරික කටයුතුවල නිරත වීමට ඔවුන්ට අනන්ත බාධා එල්ල වී ඇත. එය රැකියාවේ නිදහසට ඇති මූලික අයිතිවාසිකම සහ ආදිවාසීන්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශයේ ප්‍රතිපත්තිමය ස්ථාවරයන් සහ ILO හි ආදිවාසී සහ ගෝත්‍රික ජනතා සම්මුතිය උල්ලංඝනය කිරීමකි. නිදසුනක් වශයෙන්, මසුන් ඇල්ලීම, මී පැණි අස්වැන්න නෙළීම සහ හේන් වගාව ඇතුළු ජීවනෝපාය කටයුතුවල නිරත වීම සම්බන්ධයෙන් ආදිවාසී ප්‍රජාවන්ට අයත් සාමාජිකයන් අත්අඩංගුවට ගෙන නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ සිද්ධීන් නිතර දක්නට ලැබේ.

## ප්‍රතිපත්ති සහ භාවිතයට අදාළ ප්‍රතිසංස්කරණ සඳහා යෝජනා

1. ආදිවාසී ප්‍රජාව සහ අදාළ පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා කර ඔවුන්ගේ පැවැත්මට මූලික වන සහ ඔවුන්ගේ සියලු විශ්වාසයන්, චාරිත්‍ර වාරිත්‍රවලට කේන්ද්‍රීය වන ඉඩම් සහ ඔවුන්ගේ ජීවිත අතර ඇති විශේෂ සම්බන්ධතාවයට සංවේදීව ආදිවාසී ප්‍රජාවගේ සුවිශේෂී ලක්ෂණ සහ අවශ්‍යතා ඇතුළත් කරමින් ස්වකීය සම්ප්‍රදායන් සහ සංස්කෘතිය සුරක්ෂිත වන අන්දමේ පනත් කෙටුම්පතක් ඉදිරිපත් කර විධිමත් නෛතික රාමුවක් සැකසීම.

2. ආදිවාසී ජනතාවගේ අයිතිවාසිකම් සාමාන්‍ය මානව හිමිකම් සහ සුළුතර අයිතිවාසිකම්වලට සීමා නොවේ. ආදිවාසී සහ ගෝත්‍රික ජනතා සම්මුතියේ (ILO අංක 169 සම්මුතියේ) සහ ආදිවාසී ජනතාවගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනයේ (UNDRIP) දක්නට ලැබෙන පරිදි ආදිවාසී ජනතාවට විශේෂිත වූ අයිතිවාසිකම් සාමූහික අයිතිවාසිකම් ලෙස සකස් කළ යුතුය. ආදිවාසී ජනතාවගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනයේ විධි විධානවලට ගරු කිරීමට රාජ්‍යයේ කැපවීම විධිමත් ලෙස පිළිගනිමින් ආදිවාසී සහ ගෝත්‍රික ජනතා සම්මුතිය, 1989 (ILO සම්මුතිය 169) අපරානුමත කිරීමට රජය අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

3. ආදිවාසී ප්‍රජාවන්ගේ පාරම්පරික වාසස්ථාන සහ ඔවුන්ගේ ජීවනෝපාය කටයුතුවල නියැලීම වළක්වන සහ භාවිතයට අසාධාරණ ලෙස බාධා පමුණුවන මෙන්ම ඔවුන්ගේ ජීවනෝපායට අදාළ ක්‍රියාකාරකම් අපරාධනීය වරදවල් වශයෙන් අර්ථ දක්වන වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත, වන සංරක්ෂණ ආඥාපනත, වෙරළ සංරක්ෂණ පනත සහ අනෙකුත් නීති සහ ප්‍රතිපත්ති ඇතුළුව නමුත් ඒවාට පමණක් සීමා නොවී පවතින වෙනත් නීති සමාලෝචනය කිරීමට රජය අවශ්‍ය පියවර ගත යුතුය.

4. ආදිවාසී ප්‍රජාවන්ගේ මූලික අයිතීන් හැල්ලුවට ලක් කරන සහ ඔවුන්ගේ පැවැත්ම අනතුරේ හෙළන තාවකාලික නියාමන ක්‍රියාමාර්ග පනවනු වෙනුවට එවැනි නීති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහ මානව ක්‍රියාකාරකම් නිසි ලෙස නියාමනය කිරීම සහතික කිරීම අදාළ රාජ්‍ය බලධාරීන්ගේ වගකීමකි.

5. ආදිවාසී යන පුළුල් නිර්වචනයේ කොටසක් ලෙස දැනට හඳුනාගෙන ඇති සහ පවතින විවිධ ජන කණ්ඩායම්වල සමාජ-ආර්ථික පැතිකඩ පිළිබඳ විස්තීරණ සංගණනයක් පැවැත්වීමේ බලයක් සහිත **"ශ්‍රී ලංකාවේ ආදිවාසී ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ස්වාධීන කමිටුවක්"** රජය විසින් පත් කළ යුතුය. එවැනි කමිටුවක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නියෝජිතයින්, ආදිවාසී කණ්ඩායම් ජීවත්වන භූගෝලීය ස්ථානවල දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය පරිපාලනවල අදාළ නියෝජිතයින්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, පරිසර අමාත්‍යාංශය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, පොලිස් දෙපාර්තමේන්තුව, මහවැලි සංවර්ධන අධිකාරිය, ඉඩම් අමාත්‍යාංශය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, ආයුර්වේද දෙපාර්තමේන්තුව, ධීවර දෙපාර්තමේන්තුව, අධ්‍යාපන අමාත්‍යාංශය සහ වෙනත් ඕනෑම අදාළ අධිකාරියක නියෝජිතයන්ගෙන් සමන්විත විය යුතුය. මෙම කමිටු වාර්තාවට රට පුරා ආදිවාසී ප්‍රජාවන්ගේ ව්‍යාප්තිය සිතියම්ගත කිරීම සහ එම ප්‍රජාවන් මුහුණ දෙන, උපදේශන මගින් රැස්කරගත් සාක්ෂි පදනම් කරගත් දත්ත සහ තොරතුරු සමඟින් සමාජ-ආර්ථික හා දේශපාලන ගැටලු පිළිබඳ විශ්ලේෂණයක් ඇතුළත් විය යුතුය.

6. ශ්‍රී ලංකාවේ ආදිවාසී ප්‍රජාවලට අයත් විවිධ ප්‍රජා කණ්ඩායම් මුහුණ දෙන මතුවන ගැටලු සහ අභියෝග සමාලෝචනය කිරීම සඳහා වඩාත් සුදුසු ආංශික අධීක්ෂණ කාරක සභාවක් යටතේ රජය විසින් පාර්ලිමේන්තු අනුකමිටුවක් පත් කළ යුතුය. තවද, එවැනි අනුකමිටුවක් විසින් පත් කළ යුතු **"ශ්‍රී ලංකාවේ ආදිවාසී ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ස්වාධීන කමිටුව"** විසින් ඉදිරිපත් කරන වාර්තාවන් වෙත යොමු විය යුතුය.

7. ස්වදේශ කටයුතු අමාත්‍යාංශය, "ශ්‍රී ලංකාවේ ආදිවාසී ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ස්වාධීන කමිටුව" සහ එම පාර්ලිමේන්තු අනුකමිටුව සමඟ සමීප සම්බන්ධීකරණයෙන්, කෙටිකාලීන විසඳුමක් ලෙස, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමේ පරිපාලන කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් රාජ්‍ය නිලධාරීන් සඳහා ආචාරධර්ම පද්ධතියක් නිර්මාණය කළ යුතුය. ආදිවාසී ප්‍රජාවන් සඳහා අඛණ්ඩව වෙනස් කොට සැලකීමට එරෙහිව සටන් කිරීමට සහ ඔවුන්ගේ සමානාත්මතාවට ඇති අයිතියට ගරු කරමින් පොදු සේවාවන් සැපයීමට ස්ථිර ක්‍රියාමාර්ගයක අවශ්‍යතාව පිළිබඳව ඔවුන්ව දැනුවත් කළ යුතුය.

8. ආදිවාසී ප්‍රජාවන්ගේ අයිතීන් තහවුරු කිරීමට සහ ඔවුන්ගේ සිවිල්, දේශපාලන, සමාජ-ආර්ථික හා සංස්කෘතික අයිතීන් ආරක්ෂා කිරීම සඳහා පළාත් ආණ්ඩු සහ පළාත් පාලන ආයතන විසින් ප්‍රඥප්ති සහ අතුරු ව්‍යවස්ථා සකස් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.

9. ආදිවාසී ප්‍රජාවන් ජාතික සංගණනයට ජනවාර්ගික කණ්ඩායමක් ලෙස ඇතුළත් නොකිරීමට ගත් තීරණයම, වෙනස් කොට සැලකීම සහ බැහැර කිරීම පිළිබඳ උදාහරණයක් වන අතර, ආදිවාසී ජනතාවගේ අනන්‍යතාව ගෝලීය වශයෙන් පිළිගැනේ. ආදිවාසීන්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනයේ 8(2)(අ) වගන්තියේ මේ පිළිබඳව සඳහන් වන්නේ "විශේෂිත ජනතාවක් ලෙස

ඔවුන්ගේ අඛණ්ඩතාව හෝ ඔවුන්ගේ සංස්කෘතික වටිනාකම් හෝ වාර්ගික අනන්‍යතාවයන් අහිමි කිරීමේ අරමුණක් හෝ බලපෑමක් ඇති කරන ඕනෑම ක්‍රියාවක්"[7] යන්නයි. මේ අනුව, ආදිවාසි ප්‍රජාවන් පිළිගැනීම සහතික කිරීම සඳහා රජය හැකි සෑම ආකාරයකින්ම සුදුසු ස්ථිර ක්‍රියාමාර්ග ගත යුතුය.

10. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, අදාළ දිස්ත්‍රික් පරිපාලන සමඟ සම්බන්ධීකරණයෙන් සහ සහයෝගයෙන්, වෙනත් කාණ්ඩය යටතේ ආදිවාසී ජනගහනයේ සංඛ්‍යා ඇතුළත් කිරීමේ ප්‍රවණතාව වෙනුවට ආදිවාසී ප්‍රජාවන් පිළිබඳ දත්ත රැස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය[8]. ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන් කරන ලද දත්ත එක්රැස් කර ලේඛනගත කළ යුතුය. තවද, දිවයින පුරා ආදිවාසී ප්‍රජාවන්ගේ ව්‍යාප්තිය අවබෝධ කර ගැනීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ දත්ත රැස්කිරීමේ ක්‍රියාවලීන් පවත්වන ලෙස දිස්ත්‍රික් ලේකම්වරුන් දිස්ත්‍රික් මට්ටමේ සංගණන හා සංඛ්‍යාලේඛන භාර නිලධාරීන්ගෙන් ඉල්ලා සිටිය යුතුය. ආදිවාසී ප්‍රජාවන් නොවැදගත් ලෙස සලකන රාජ්‍ය නිලධාරීන්ගේ සහ ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ ආකල්ප වෙනස් කළ යුතුය.

11. ක්ෂුද්‍ර මූල්‍ය, ක්ෂුද්‍ර ණය සහ වෙනත් ආකාරයේ නියාමනය නොකළ ණය දීමේ ක්‍රියාකාරකම් හේතුවෙන් ආදිවාසී ප්‍රජාවන්ට ඇති වී තිබෙන බලපෑම ඇගයීමට ශ්‍රී ලංකා මහ බැංකුව සහ අනෙකුත් බලධාරීන් විසින් පියවර ගත යුතුය. මීට අමතරව, අනවසර පුද්ගලයින් සහ ආයතන ආදිවාසි ප්‍රජාවන් ණය ගැතියන් බවට පත් කිරීම හා පසුව ඔවුන්ගේ චංචල සහ නිශ්චල දේපළ මුදල් ණය දෙන්නන්ට හෝ එවන් ආයතනයන්ට විකිණීමෙන් ඔවුන්ගේ වත්කම් අහිමි වීම වැළැක්වීමට බලධාරීන් වහා පියවර ගත යුතුය. ක්ෂුද්‍ර මූල්‍ය ප්‍රශ්නයට විසඳුම් සෙවීමේදී ආදිවාසී ප්‍රජාවගේ බහුවිධ ප්‍රශ්නවලටද අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ මන්ද යත් ඉඩම්, ජීවනෝපාය, අනන්‍යතාව සහ සංස්කෘතිය සංකීර්ණ ලෙස එකිනෙක හා බැඳී ඇති අතර වෙන් කළ නොහැකි ලෙස පවතී. ඕනෑම අර්ථවත් විසඳුමක් තිරසාර ලෙස ළඟා කර ගැනීම සඳහා, ඔවුන්ගේ පැවැත්මට මූලික වන සහ ඔවුන්ගේ සියලු විශ්වාසයන්, සිරිත් විරිත්වලට කේන්ද්‍රීය වන ඔවුන්ගේ ඉඩම් අතර ගැඹුරු සහ විශේෂ සම්බන්ධයට සංවේදීතාවයෙන් සම්පූර්ණ උල්ලංඝනය කිරීම් සහ උල්ලංඝනයන් ඔවුන්ගේ රාමුව තුළ සලකා බැලිය යුතුය. සම්ප්‍රදායන් සහ සංස්කෘතිය, ILO අංක 169 දරන සම්මුතියේ සහ ආදිවාසී ජනතාවගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනයේ (UNDRIP) දක්නට ලැබෙන පරිදි ආදිවාසී ජනතාවට විශේෂිත වූ අයිතිවාසිකම් සාමූහික අයිතිවාසිකම් ලෙස සකස් කළ යුතුය.

12. ඉඩම් අමාත්‍යාංශය, ප්‍රධාන වශයෙන් කෘෂිකර්ම හා වනජීවී සහ වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය (වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව) ඇතුළුව දිස්ත්‍රික් පරිපාලන සහ අනෙකුත් අදාළ බලධාරීන් සමඟ සහයෝගයෙන් ආදිවාසී ප්‍රජාවන්ගේ පාරම්පරික උරුමයන් සමාලෝචනය කළ යුතු අතර ඉඩම් සහ ජලය සඳහා ඔවුන්ගේ අයිතිය අහිමි කරන අත්තනෝමතික පරිපාලන තීරණ නතර කළ යුතුය. 1989 ආදිවාසී සහ ගෝත්‍රික ජනතා සම්මුතියේ 14 වන වගන්තිය (ILO සම්මුතිය 169) ට අනුව "ආදිවාසීන් සම්ප්‍රදායිකව සිටින සහ හිමිකම් දරන ඉඩම්වල අයිතිය සහ හිමිකම් රජය විසින් පිළිගත යුතුය". තවද, ඔවුන්ගේ ඉඩම්වල හිමිකම් ගැටලු විසඳීම සඳහා ජාතික නීති පද්ධතිය තුළ ප්‍රමාණවත් ක්‍රියා පටිපාටි ස්ථාපිත කළ යුතුය.

13. ආදිවාසී ප්‍රජාවන්ගේ පැවැත්ම පිළිබඳ මතුවන ගැටලු ආමන්ත්‍රණය කිරීමේ "ප්‍රශ්න පදනම් කරගත්" ප්‍රවේශය රජය විසින් නතර කළ යුතු අතර ඒ වෙනුවට එම ප්‍රජාවන්ට තමන් විසින්ම භූමියේ පුරවැසියන්ගේ කොටසක් ලෙස සලකන බව ඒත්තු ගැන්වීම සඳහා "ප්‍රතිපත්ති පදනම් කරගත්" ප්‍රවේශයක් අනුගමනය කිරීමට දේශපාලන කැමැත්තක් පෙන්නුම් කළ යුතුය. ඔවුන්ගේ අනන්‍යතාව,

---

[7] https://www.un.org/development/desa/indigenouspeoples/wp-content/uploads/sites/19/2018/11/UNDRIP_E_web.pdf

[8] The last census in which population data related "Adivasi Communities' had been gathered only in 1963 and since then, in four rounds of national census (1971, 1981, 2001 and 2011), data of Adivasi (Veddha) community has been included under "Other" category. http://www.statistics.gov.lk/Population/StaticalInformation/CPH2011/CensusPopulationHousing2012-FinalReport

ස්වයං නිර්ණය, සුවිශේෂී වාසස්ථාන, මුතුන් මිත්තන්ගේ ප්‍රදේශ, ප්‍රධාන වශයෙන් ඉඩම් සහ ජලය, භාෂාව සහ සංස්කෘතික භාවිතයන් ඇතුළු ස්වභාවික සම්පත් වෙත ප්‍රවේශය සඳහා රාජ්‍යයේ පිළිගැනීම අවශ්‍ය වේ.

14. ආදිවාසී ප්‍රජාව යනු ස්වභාවික සම්පත් විනාශ කරන අපරාධකරුවන් නොව, පරිසර පද්ධතිය සුරැකීමේ භාරකාරීත්ව වගකීම සහිත ප්‍රජාවක් බව රාජ්‍යය විසින් හඳුනා ගත යුතුය. තවද, රට පුරා සිටින ආදිවාසි ප්‍රජාවන් ඔවුන්ගේ වාසස්ථාන සහ ජීවන මාර්ග ද පරිසර පද්ධති ද ආරක්ෂා කිරීම අදහස් කරගෙන යොදා ඇති, පවතින නීති සහ ප්‍රතිපත්ති කෙරෙහි වඩාත් සංවේදී වීම සඳහා දැනුවත් කිරීම ප්‍රවර්ධනය කිරීම ඇතුළු ස්ථිර ක්‍රියාමාර්ග ආරම්භ කළ යුතුය. එවැනි මැදිහත්වීමක් මගින් ආදිවාසී ප්‍රජා සාමාජිකයින් අඩු නිසා පමණක් ඔවුන් අනෙකුත් ප්‍රජාවන්ගේ ජීවන මට්ටමට උකහා ගැනීමේ අවදානම වැඩි වීම වැළැක්විය යුතුය.

VOICE OF CITIZENS

CPA

Centre for Policy Alternatives

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

www.facebook.com

www.twitter.com

www.youtube.com